කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානව ශාස්ත්‍ර පීඨය

# සිංහල

## භාෂා පරිණාමය, පුරාක්ෂර විද්‍යාව හා කලාශිල්ප SINH – E 3025

පළමු වන ප්‍රශ්නය ද දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

### I කොටස

01. I

පහත සඳහන් පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.
(පළමු ප්‍රශ්නය සඳහා පැයක පමණ කාලයක් සෑහේ.)

* කණගම ර(ඣශ) තිශහ ඣිත ශමණිය ලෙණෙ
* පරුමක නග පුත අසලිය ලෙණෙ අගත අනගත චතුදිශික සගයෙ
* පරුමක නමලි ශුමන පුත පරුමක නමලිය ලෙණෙ ශගශ
* ගමණි ධමරඣශ පුතශ අය අශලිශ ලෙණෙ,
* ගමණි ධමරඣශ පුතශ අය අශලිශ ලෙණෙ (ලකුණු 10 යි)

II

මඟුල් සිහසුන් රක් ගල් තල අරය් වජන් බෙරසීනය්නෙන් රුපු
වරණන් ඇඩි මහ සින්දැ සී පැරුක්මෙන්

වැජඹැ අනත් අපිරිසෙය් සොම් නිමල ගුණ වතුරෙන් ජියල්
සනහය් සසුන් අරියූ ලක්දිව් පොළොව් මෙහෙ -

සන පරපුරෙන් හිමි මපුරුම් බුදදස් සිරිසඟ්බොයි අබහය්
මහරජ්හට් ජා සග් බඩය අප බිසෙව්

රජ්නැණියන් කුස්හි හෙවැ දුනු සැණැහි මෙ යුවරජ් බිසෙව්
සිරි පැමැණැ යස තෙජ් හිර් සන්ද්නෙන් ලොව් පහ -

යය් සිය වික්මෙන් සතුරන් මැඩැ පළ නිමල කිත් වතුරෙන්
ලොවත් පතුළ් දෙබිසෙවැ ජා සලමෙය්වන් අබ -

හය් මහරජ්යුතාර් මිරිසවිටි සඟ්සෙන් අරම් කසුබ්රජ් මහවෙහෙර්
කරය් අරි පන්සීයන් වසවය් සුලබ්

සතර් පසයෙන් පුජය් සසුන් කොත් හුවය් ඇතිනකරැ මඟුල්
මහවෙයැ දකුණ් දොර් අසන්හි රජ්වෙද්හල්
කරය් රොව් බිය සමය් (ලකුණු 10 යි)

III

බ(ද්‍ර) මීනු ලහසියෙන් මි-
-සැ සෙසු ලහසියෙ-
-න් නො මතනු ඉසා-
ගම් වන් බඩු ගැමැ වික්-
-ක මිසැ ගෙනැ යත් සුත්
වත් නො ගන්නා ඉසා (1*) නො
පැ විකි බඩියෙහි දීණ
සුත්වත් ගනුත් මිසැ
ආකුල නො කරනු ඉසා (1*)
නොවැටු මදඩියෙත් නො
යෙන්) නොකිරනු ඉසා (1*) සු-
-ත් බඩු නොතනැ හිඳැ
නො විකුණනු ඉසා (1*) ස-
-ල් නොකළමනා තැනැ නො
කිරනු ඉසා (1*) සල් නො-
කළමනවුන් නො කිරනු
(ඉ) සා (1*) කුළුමසු පුරවත්
වී මිසැ වැටෙන මසු
උනු කොට නො ගන්නා
කොට ඉසා (1*) බුලත් පු-
-වක් මඩපයෙ තබා
විකුණනු කොට ඉසා (1*) නො
තැනැ තබා වික්ක දුටු
-වා රදොලත් හරවා ග
-න්නා ඉසා (!*) දෙමුළැ බද්
වල්වලැ දඩුපත් නො
කපනු කොට ඉසා (!*) මෙ
-හෙකරුවනට ආකුල
නො කරනු ඉසා

(ලකුණු 10 යි)

IV

මෙහි ඇතුළත්තාක් තැනැ කුහිවකු මරා කෙ(ටුව)
කඩපළා සොරකම් කළ තිරැ කොට් ගෙනැ දස ගැමැ ඇ
ත්තන් හින්දැ විචාරා උපන් දැයට් පැ හැකිසේ ලියා
තබා මැරුවෙහු මරා පට්වනු කොට් ඉසා කඩපළා සොරු
න් ගත් අයතියෙන් නියතකළාක් අයිතිය (හි)මි
හට් ගෙන දී එල්වනු කොට් ඉසා තිරැ නොකළ දසගැ
මැ ඇත්තන් පන්සාලිස දවසෙකින් සොයා ගෙනැ පට්
වනු කොට් ඉසා සොයා නො ගත දස ගැමින් එක්
සිය පස්විසි කළන්දක් රන් රදොලට් දෙනු කොට් ඉසා
නො මරා කෙටුව දිව්මිලැ පනාස් කළන්දක් රන් ගන්නා
කොට් ඉසා නො පොහොත් ගෙදඩ් ගන්නා කොට් ඉසා තිරැ
නොකළ දසගැමින් පනාස් කළන්දක් රන් රදොලට් දෙනු කො
ට් ඉසා අත්පාවහලට් ගියාකුගෙන් දඩැ පනාස් කළ
න්දක් රන් ගන්නා කොට් ඉසා

(ලකුණු 10 යි)

හෝ

පහත සඳහන් ශිලාලිපි කියවා වර්තමාන අකුරින් ලියන්න.



(ලකුණු 10 යි)

## II කොටස

02. මිහින්තලා ගුහා ලිපිවලින් කිනම් භාෂා යුගයක් නියෝජනය වේදැ'යි නිදසුන් දෙමින් පහදන්න. (ලකුණු 15 යි)

03. මධ්‍යතන සිංහල යුගයේදී සිංහල අක්ෂර මාලාවේ සංවර්ධනය පිළිබඳ සාවධාන වෙමින් තත් යුගයේ භාෂා ලක්ෂණ ගැන සමාලෝචනයක යෙදෙන්න. (ලකුණු 15 යි)

04. සිංහල ලේඛන කලාවේ ආරම්භය පිළිබඳ ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රයාගත හා පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය ඇසුරින් විමර්ශනයක් කරන්න. (ලකුණු 15 යි)

05. බදුලු ටැම් ලිපිය තත්කාලීන සමාජ, සංස්කෘතික තොරතුරු අධ්‍යයනයෙහිලා ප්‍රශස්ත මූලාශ්‍රයකි. මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 15 යි)

හෝ

පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. සිංහල භාෂාවේ අනාර්ය භාෂා ලක්ෂණ
II. අශෝක බ්‍රාහ්මී අක්ෂර මාලාවේ රූපීය ස්වභාවය
III. වේවැල්කැටිය ශිලා ලිපිය
IV. සිංහල භාෂාව කෙරෙහි ඉංග්‍රීසි භාෂාවේ බලපෑම

(ලකුණු 15 යි)

## III කොටස

06. ශ්‍රී ලාංකේය කලා ශිල්පයන්හි ප්‍රභවය හා විකාශය සඳහා පදනම් වූ ඓතිහාසික පසුබිම පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 15 යි)

07. 'භාරතීය ආභාසය ලැබුව ද ශ්‍රී ලාංකේය ස්තූපයෙන් පිළිබිඹු වන්නේ දේශීය කලා නිර්මාණ ශිල්පීන්ගේ අනන්‍යතාවයි.' මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 15 යි)

08. 'බෝධි සත්ත්ව සංකල්පය' පැහැදිලි කරමින් අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාවන්හි ශිල්පීය ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 15 යි)

09. සීගිරි සිතුවම් කලාව පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න. (ලකුණු 15 යි)

10. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ ප්‍රමාණවත් සටහන් ලියන්න.

I. චෛතියඝර
II. ඉසුරුමුණි කැටයම්
III. මහනුවර යුගයේ චිත්‍ර
IV. ගන්ධාර බුද්ධ ප්‍රතිමා (ලකුණු 15 යි)

***************************